සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

Learning Resource Centre
R
De Mazenod College
Kandena

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

№ 008743

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 1 යි |

නම / பெயர் / Name ......................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන නිවැරදි පිළිතුර තෝරන්න.

01. ශුද්ධ බයිබලය ලේඛනගත වූ කාලය ලෙස සලකනු ලබන්නේ,
    1. ක්‍රි.පූ. 950 සිට ක්‍රි.ව. 100 දක්වා
    2. ක්‍රි.ව. 950 සිට ක්‍රි.ව. 100 දක්වා
    3. ක්‍රි.පූ. 1050 සිට ක්‍රි.පූ. 1000 දක්වා
    4. ක්‍රි.පූ. 1050 සිට ක්‍රි.ව. 100 දක්වා

02. දේව අනාවරණයේ ප්‍රධාන මූලාශ්‍රයක් වනුයේ,
    1. ශුද්ධ වූ සභාව 2. දේව මැවිල්ල 3. මිනිසා 4. ශුද්ධ බයිබලය

03. එළිදරව් සාහිත්‍යය තුළ පරිපූර්ණත්වය සංකේතවත් කරන සංඛ්‍යා සංකේතය වන්නේ,
    1. 12 ය. 2. 10 ය. 3. 7 ය. 4. 4 ය.

04. ප්‍රඥා සාහිත්‍යයට අයත් වන ග්‍රන්ථයක් වන්නේ,
    1. ජෝබ් 2. 1 මකබ්වරු 3. එස්රා 4. එස්තර්

05. ජේසුස් වහන්සේ උකුත් වූ අවස්ථාවේ, පරිසරයේ ඇති වූ වෙනස්කමක් වන්නේ,
    1. හිරු දීප්තියෙන් බැබළීම
    2. රට පුරා අන්ධකාරයක් පහළ වීම
    3. ධාරානිපාත වර්ෂාවක් ඇද හැලීම
    4. දේව මාලිගාව විනාශ වීම

06. එම්මාවුස් බලා ගමන් කළ ගෝලයන් දෙදෙනා ජේසුස් වහන්සේව හඳුනාගත්තේ,
    1. උන් වහන්සේ ප්‍රාතිහාරයක් සිදු කළ අවස්ථාවේ.
    2. රොටි ආශිර්වාද කර කඩා දුන් අවස්ථාවේ.
    3. උන් වහන්සේ යාච්ඤා කළ අවස්ථාවේ.
    4. උන්වහන්සේ සමග කතා කරමින් යන අවස්ථාවේ.

07. පේදුරු තුමාගේ ප්‍රථම දේශනය සිදු කළේ,
    1. මොරියා කන්දේදී.
    2. ජෙරුසලම් චතුරශ්‍රයේදී.
    3. සිලෝවම් පොකුණ අසලදී.
    4. කොරින්තියේදී.

08. පේදුරු තුමාගේ දේශනයෙන් පසුව මනස්ථාපනය වී බෞතීස්මය ලැබූ ගණන වනුයේ,
    1. 1000 ක් පමණ 2. 2000 ක් පමණ 3. 3000 ක් පමණ 4. 5000 ක් පමණ

09. මුල් කිතුනු සභාව තුළ සහනාධාර බෙදා දීමේ දී ඇතිවූ ගැටලුව නිරාකරණය කිරීම සඳහා පත් කළේ,
    1. අයකැමියන් 2. ලේකම්වරු 3. උපස්ථායකවරු 4. ඒකක නායකයින්

10. ශුද්ධ වූ සභාවේ පළමු ප්‍රාණ පරිත්‍යාගිවරයා
    1. ශුද්ධ වූ ජාකොබ් තුමා ය.
    2. ශුද්ධ වූ ජුවාම් තුමා ය.
    3. ශුද්ධ වූ පේරුදු තුමා ය.
    4. ශුද්ධ වූ ස්තේපන් තුමා ය.

11. පේදුරුතුමා සිය මහා ප්‍රකාශය සිදු කරනු ලැබුවේ,
1. පිලිප්පි කයිසාරියේ දී
2. තිබේරියස් මුහුද අසල දී
3. කපර්ණාවුමේ දී
4. ජෙරුසලම් දේව මාලිගාවේ දී

12. ''කිසියම් කෙනෙකු මුළු ජීවිත කාලය තුළ ම නොසලකා හැරිය දෙයක් ඔහුගේ මරණ මොහොතේ දී ඉටු කර ගත නොහැකි ය'' යනුවෙන් පැවසුවේ,
1. ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමා
2. ශුද්ධ වූ පේදුරුතුමා
3. ශුද්ධ වූ අගුස්තීනුතුමා
4. ශුද්ධ වූ ජුසේ වාස් පියතුමා

13. ප්‍රදේශයේ සිටින යාචකයන් පුනරුත්ථාපනය කර ශ්‍රමාභිමානි පිරිසක් බවට පත් කිරීම සිදු කරන ලද්දේ,
1. ශුද්ධ වූ ජුසේවාස් මුනිතුමා.
2. ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා.
3. ගරු මයිකල් රුද්‍රිගු (නි. ම. නි.) පියතුමා.
4. ශුද්ධ වූ තෙරේසා මවුතුමිය.

14. තම ගැලවීම හා පව් සමාව දෙවියන් වහන්සේගෙන් යයි, බලාපොරොත්තු නොවීම හඳුන්වනු ලබන්නේ,
1. දයාධික මනස්ථාපනය යනුවෙනි.
2. ඉච්ඡාභංගත්වය යනුවෙනි.
3. භයාදිකමනස්ථාපනය යනුවෙනි.
4. අනුමානය යනුවෙනි.

15. තම සහෝදරයාට ''මෝඩයා'' කියා ගරහන කවරෙකු වුවද ඔහු .......................... යටත් වනු ඇත. හිස්තැනට සිදුසු පිළිතුර වන්නේ,
1. ශ්‍රේෂ්ඨාධිකරණයට
2. නිරාගින්නට
3. දේව විනිශ්චයට
4. අධිකරණයට

16. මහෝපදේශය අංක 358 සඳහන් පරිදි, 7 වන සහ 10 පනතට අනුව, අප කරන රැකියාවේදී අප කටයුතු කළයුතු වන්නේ,
1. සාධාරණව ය
2. නිසි ලෙස වැටුප් ගෙවීම ය
3. වැටුපට සරිලන සේවාව ලබාදීම ය
4. කොන්ත්‍රාත්තු නිසිලෙස කිරීම ඉටුකිරීම ය

17. ශුද්ධ බයිබලයේ සඳහන් පරිදි දෙවියන් වහන්සේගෙන් ප්‍රඥාව පමණක් ඉල්ලා යාච්ඤා කළ අයෙකි,
1. දාවිත් රජතුමා
2. සාමුවෙල් දිවැසිවරයා
3. සාමුවෙල් රජතුමා
4. සලමොන් රජතුමා

18. පොතිපර්ගේ නිවසේ සිටි ජෝසප් තුමන් හට අත් වූ විපතින් අපට උගත හැකි පාඩම වන්නේ,
1. දෙවියන් වහන්සේ අයහපතෙන් යහපතක් උදා කරන බවය.
2. දෙවියන් වහන්වසේව විශ්වාස වන්ත පුද්ගලයාට සමාජය කැමතිය නොවන බවය.
3. යහපත කරන අයට දෙවියන් වහන්සේ සහය නොවන බවයි.
4. අපගේ රාජ්‍ය නායකයන්ට අප කීකරු විය යුතු බවයි.

19. ජොසප්, පොතිපර්ගේ බිරිඳගේ අයුතු යෝජනාවට එකග වූයේ නම් කඩවන දේව පනත වන්නේ,
1. 6 සහ 7
2. 6 සහ 9
3. 9 සහ 10
4. 6 සහ 1

20. ''ඔබගේ ශරීරය ඔබට දෙවියන් වහන්සේ දෙවා වදාළ ඔබතුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ මන්දිරයේ වන බව ඔබ නොදන්නාහු ද'' යන්න පවසන ලද්දේ,
1. පාවුලුතුමා
2. පේදුරුතුමා
3. නාතාන් දිවැසිවරයා
4. ක්‍රිස්තුස් වහන්සේ

21. ''මා මරණයට පත්වුව ද මාගේ දේව ජීවිතය නැති කර ගන්නේ නැතැයි'' ක්‍රිස්තුස් වහන්සේට පොරොන්දු වූයේ කවුරුන්ද?
1. මරිය ගොරෙත්තිතුමිය.
2. ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමා
3. මරිය මිරෙන්ඩාතුමිය
4. ජුසේ වාස් පියතුමා

22. ''මෙම පොතේ ලියා නැති තවත් බොහෝ හාස්කම් ජේසුස් වහන්සේ සිදු කළසේක'' ඉහත බයිබල් පාඨය උපුටාගෙන ඇත්තේ,
1. මතෙව් සුබාරංචියෙනි.
2. ජුවාම් සුබාරංචියෙනි.
3. ලූක් සුබාරංචියෙනි.
4. මාක් සුබාරංචියෙනි.

23. මරියදාව හා සම්බන්ධ භාග්‍ය වන්නේ,
1. බැගෑ සිතින් දෙවි සරණ පතන්නෝ භාග්‍යවන්තයෝ ය, ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේ ය.
2. නිහතමානී ගුණ ඇත්තෝ භාග්‍යවන්තයෝ ය, ඔවුහු දේශය උරුම කරගන්නෝ ය.
3. නිර්මල සිත් ඇත්තෝ භාග්‍යවන්තයෝ ය, ඔවුහු දෙවියන් වහන්සේව දකින්නෝ ය.
4. දයාවන්තයෝ භාග්‍යවන්තයෝ ය, ඔවුහු දයාව ලබන්නෝ ය.

24. 6 වන දේව පණතට විරුද්ධ ක්‍රියාවකි,
1. හොර ඡන්ද දැමීම. 2. කට කතා පැතිරවීම. 3. දික්කසාදය. 4. ඉච්ඡානුභංගත්වය

25. ආත්මික සූදානම යනු,
1. ප්‍රේමයේ පනත පිළිපැදීම ය. 2. එක් වරු ශීලය රැකීම ය.
3. ආත්මය කැපකිරීම ය. 4. පාපයෙන් තොර වීම ය.

26. ජන වන්දනා වර්ෂය තුළ බලාපොරොත්තුව සහ වර්ධනය සංකේතවත් කිරීමට භාවිතා කරන වර්ණය වන්නේ,
1. සුදු වර්ණය යි. 2. රතු වර්ණය යි. 3. කොළ වර්ණය යි. 4. දම් වර්ණය යි.

27. සත්‍යවාදී වීම සහ සත්‍යට සාක්ෂි දැරීමට නියම වන්නේ,
1. 5 වන දේව පනතිනි. 2. 9 වන දේව පනතිනි.
3. 7 වන දේව පනතිනි. 4. 8 වන දේව පනතිනි.

28. සලමොන් රජතුමා දෙවියන් වහන්සේට දවන යාග පූජා දහසක් ඔප්පු කරන ලද්දේ කිනම් කන්ද මත ද?
1. සීනයි කන්ද මත 2. ගිබියොන් කන්ද මත
3. කාර්මෙල් කන්ද මත 4. මොරියා කන්ද මත

29. සෑම වසරකම ජනවාරි 18 - 25 දක්වා විශේෂයෙන් යාච්ඤා කිරීමට අපට අවධාරනය කරන්නේ කිනම් අරමුණක් සඳහා ද?
1. සභා නායකයන් උදෙසා 2. ලෝක සාමය උදෙසා
3. නව වසරේ සැලසුම් උදෙසා 4. කිතුනු සභා එකමුතුව උදෙසා

30. පහත කරුනු අතරින් දිව්‍ය පූජාව තුළ ආරම්භයේ දක්නට ලැබෙන ගෞරවයේ සංඛේත සඳහන් නිවැරදි පිළිතුර වන්නේ,
a. නමස්කාරය
b. පොදු යැදුම
c. පූජාසනය සිපාචාරය
d. සුවඳ දුම් ඇල්ලීම
e. පශ්චත්තාපයේ පිළිවෙත
f. දල්වන ලද පහන්

1. A, B, C සහ F 2. A, C, D සහ F 3. A, B, C සහ D 4. B, C, D සහ E

31. දිව්‍ය සත්ප්‍රසාදීය ලක්ෂණයක් ලෙස "යාගය" යන්න සඳහන් වීමට හේතුව වන්නේ,
1. එහිදී සක්‍රමේන්තු ආකාරයෙන් අප ජේසුස් වහන්සේව ලබාගන්න නිසා ය.
2. ක්‍රිස්තුන් වහන්සේ සිහිකිරීම පිණිස සිදු කරන නිසා ය.
3. ක්‍රිස්තුන් වහන්සේ අපි උදෙසා රුධිරය වගුර වන නිසා ය.
4. ක්‍රිස්තුන් වහන්සේ පූප හා රොටි වෙනුවෙන් තුති පුදන නිසා ය.

32. ලංචියාන නුවර දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්යයේ රුධිර වර්ගයට සමාන රුධිර වර්ගයක් මින් පෙර හමු වී ඇති නිවැරදි ස්ථානය වන්නේ,
1. ක්‍රිස්තුස් වහන්සේගේ කටු ඔටුන්නෙහි ය 2. ක්‍රිස්තුන් වහන්සේව ඇණ ගැසූ ඇණ වලිනි.
3. ටියුරින් නුවර ශ්‍රී සලුවෙනි. 4. පියෝ පියතුමන්ගේ ශ්‍රී වණ කැළැල් වලිනි.

33. ශුද්ධ වූ පාවුලු තුමන් කොරෙන්ති සංසයට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ පිළිබඳව කරන අනුශාසනාවේ හරය වන්නේ,
1. ප්‍රේමයේ සේවයන් අතපසු කර දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම වැරදි ය.
2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබාගැනීමට සූදානම් විය යුතු ය.
3. දේව ප්‍රේමය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් අපට විදහා දක්වයි.
4. ක්‍රිස්තුස් වහන්සේ අප උදෙසා උතුම්ම යාගය ඔප්පු කළ බව ය.

34. ක්‍රිස්තුස් වහන්සේගේ කල්වාරි යාගය උන්වහන්සේ නැවත නැවත ඔප්පු නොකිරීමට හේතුව වන්නේ,
1. ක්‍රිස්තුස් වහන්සේ දේව පුත්‍රයා වන නිසා ය.
2. ක්‍රිස්තුස් වහන්සේගෙන් පසු එය ගෝලයින් විසින් සිදු කරන නිසා ය.
3. ක්‍රිස්තුස් වහන්සේ කල්වාරියේදී සම්පූර්ණ යාගයක් ඔප්පු කරන නිසා ය.
4. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අප සමඟ නිරන්තරයෙන් වැඩ වසන නිසා ය.

35. ශුද්ධ වන්ත තෙරේසා මව් තුමිය විසින් ආරම්භ කරන පැවිදි නිකාය වන්නේ?
   1. දයාවේ දූතිකාවන්ගේ පැවිදි නිකාය
   2. දයාවේ සොයුරියන්ගේ පැවිදි නිකාය
   3. අසරණ සරණ දූතිකාවන්ගේ පැවිදි නිකාය
   4. ශුද්ධ වූ ලොරෙටෝ පැවිදි නිකාය

36. නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයකි.
   1. මරියතුමියගේ නිර්මල පිළිසිඳීමේ මංගල්‍යය.
   2. රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය.
   3. ක්‍රිස්තු රජානන්ගේ මංගල්‍යය.
   4. මරියතුමියගේ උපන් මංගල්‍යය.

37. දිව්‍ය පූජාව ආරම්භ වන්නේ,
   1. පව් කමාවෙනි.
   2. කුරුසියේ ලකුණකි.
   3. හැඳින්වීමෙනි.
   4. ආරම්භක ගීතිකාවෙනි.

38. තියෝපිලස් යන නමෙහි අර්ථය වන්නේ,
   1. දෙවියන් වහන්සේ අප සමගය.
   2. දෙවියන් වහන්සේගේ පුත්‍රයා.
   3. දෙවියන් වහන්සේගේ සේවකයා.
   4. දෙවියන් වහන්සේගේ මිත්‍රයා.

39. පුදසුන සූදානම් කිරීමේ පිළිවෙතට අයත් අනු කොටසකි.
   1. පඬුරු පෙරහැර
   2. විශ්වාසිකයින්ගේ යාච්ඤා
   3. විශ්වාස ලක්ෂණය
   4. ස්තෝත්‍ර යාගික යැඳුම

40. මල් උයනේ යාච්ඤාවෙන් පෙන්නුම් කරණ කරුණකි.
   1. ගෝලයන් අතහැර යාම පිළිබඳව
   2. ක්‍රිස්තුස් වහන්සේගේ දේවත්වය
   3. ක්‍රිස්තුස් වහන්සේගේ චිත්ත පීඩාව
   4. ක්‍රිස්තුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

Learning Resource Center
R
De Mazenod College
Kandana

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
**Year End Evaluation - 2024 (2025)**

№ 008856

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper | II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..........................

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.
- තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් සමග ප්‍රශ්න 5ට පිළිතුරු සැපයිය යුතුවේ.

---

1. i. සිරගතව සිටය දී පාවුලුතුමා විසින් ලියන ලද ලිපි දෙකක් නම් කරන්න.
   ii. හෙබ්‍රව් ප්‍රඥාවේ ප්‍රභේද දෙකක් නම් කරන්න.
   iii. ක්‍රිස්තුස් වහන්සේ කුරුසපත් වීමට කුරුසය රැගෙන ගිය ගමනේදී මෙන්ම කපාල කන්දේ දී උන්වහන්සේට සහය වූ දෙදෙනකුගේ නම් කරන්න.
   iv. ක්‍රිස්තුස් වහන්සේ අන්තිම රාත්‍රී භෝජනය අවස්ථාවේ රොටී සඳහා කරන ලද ක්‍රියා 2 නම් කරන්න.
   v. දවන යාග පූජා වර්ග දෙකක් නම් කරන්න.
   vi. ඉච්ඡාභංගත්වය සහ අනුමානය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.
   vii. මර්යාදාවට අනුව ජීවිතය හැඩගස්වා ගැනීමේ දී පිළිපැදිය යුතු කරුනු 2 සඳහන් කරන්න.
   viii. බ්‍රිතාන්‍ය යුගයේ මෙරටට පැමිණි පැවිදි සොයුරන්ගේ නිකායන් 2 නම් කරන්න.
   ix. මහෝපදේශයේ සඳහන් පරිදි පෞද්ගලික දේපල පිළිබඳ ඉගැන්වීම් දෙකක් නම් කරන්න.
   x. ජනවන්දනා වර්ෂයේ සාමාන්‍ය සමය අදියර දෙකකින් යුක්තය. ඒවා නම් කරන්න. (ලකුණු 2 × 10 = 20)

2. i. නව ගිවිසුමේ සඳහන් වෙනත් හයුන් සඳහා භාවිතා කරන ලද නම් දෙකක් ලියන්න.
   ii. ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූප 3 ලියන්න.
   iii. ජීවන සහා සම්ප්‍රදායේ ඇති වැදගත් කම මුලධර්මවාදී මිතුරෙකුට පහදා දෙන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

3. i. මුල් කිතුනු සභාවේ ලක්ෂණ 2 ක් නම් කරන්න.
   ii. උපස්ථායකයන් පත් කිරීමේදී සලකා බලන ලද ගුණාංග 3 ක් නම් කරන්න.
   iii. අභිවෘද්ධි ආලෝපය සක්‍රමේන්තුව ලැබූ සිසුවෙකු ලෙස ක්‍රිස්තුස් වහන්සේට සාක්ෂි දැරිය හැකි අවස්ථා 5 ක් නම් කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

4. i. ලංචියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාද ප්‍රාතිහාර්ය පිළිබඳව කරන ලද විද්‍යාත්මක පර්යේෂණ මගින් අනාවරනය කරගත් කරුණු 2 නම් කරන්න.
   ii. ජුදා පාස්කු භෝජනයේ මූලිකාංග 3 ක් නම් කරන්න.
   iii. කල්වාරි යාගයට සහභාගීවන කතෝලික සිසුවකු වන ඔබ, එම උතුම් යාගයට ඔබින ලෙස ජීවත් වන ආකාරය කරුණු 5 විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

5. i. පළමු දේව පනත් තුන පදනම් වී ඇති කිතුණු ධර්ම ගුණ 2 ක් නම් කරන්න.
   ii. පළමු පනතට විරුද්ධ ක්‍රියා 3 ක් ලියන්න.
   iii. වර්තමාන සමාජයේ පවතින ගැටලුකාරී තත්වයන් හමුවේ පළමු පනතට අනුකූලව ක්‍රියා කළ හැකි ආකාර 5 ක් විස්තර කරන්න. (ලකුණු 2 + 3 + 5 = 10)

6. i. කතෝලික සභාව විසින් පිළිගත් කිතුනු සභාවන් 2 නම් කරන්න.
   ii. දිව්‍ය පූජාවේ පිළිවෙත් 3 නම් කරන්න.
   iii. චාතාරික සමය ආරම්භ කරන අළු බදාදා දින දිව්‍ය පූජාවට සුදුසු හැඳින්වීමක් නිර්මාණය කරන්න.
   (ලකුණු 2 + 3 + 5 = 10)

7. පහත සඳහන් මාතෘකා වලින් දෙකක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
   i. ජනවන්දනා වර්ෂය
   ii. ක්‍රිස්තුස් වහන්සේගේ මල් උයනේ යාච්ඤාව
   iii. පොදු දේපළ සුරැකීම කතෝලික අපගේ යුතුකම වන්නේ ය.
   iv. පෙන්තකොස්ත දින පේදුරු තුමන්ගේ දේශනාව සහ එහි ප්‍රතිඵල